සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

නම : ............................................... **ඉතිහාසය** කාලය : පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

---

## I කොටස

(01) ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන නීති සංග්‍රහයේ කොටසක් වන .................................. නීතිය ලන්දේසීන්ගෙන් ලද දායාදයකි.

(02) කාර්යශූර තරුණ නිලධාරියෙකු වූ .................................. සිංහල භාෂාව මෙන් ම මෙරට වැසියන්ගේ සිරිත් විරිත් ද හඳුනා ගත්තේ ය.

(03) ඉස්ලාම් ජනතාව මුද්‍රිත මාධ්‍යයෙන් දැනුවත් කිරීම සඳහා සිද්ධි ලෙබ්බේ මහතා .................................. නමින් සඟරාවක් ආරම්භ කරන ලදී.

(04) ඉංග්‍රීසීන් යටතේ හමුදා සේවයට බඳවාගත් ඉන්දියානුවන් .................................. හමුදාව වශයෙන් හැඳින්වේ.

(05) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ වයස අවුරුදු .................................. වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම ඡන්ද බලය හිමි විය.

(ඔරබි පාෂා, මුස්ලිම් නෙයිසන්, උදයභාණු, රෝම ලන්දේසි, මැක්ඩොවෙල්, ජෝන්ඩොයිලි, සිපොයි, දහ අටට, විසි එකට)

- අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් '3' ලකුණ ද වැරදි නම් 'X' වැරදි ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(06) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු කුණ්ඩසාලේ කුමාරයා නමින් ප්‍රකට ව සිටියේ ය. ( )

(07) 1818 නිදහස් සටනට නායකත්වය ලබා දුන්නේ ගොංගාලේ ගොඩබණ්ඩා ය. ( )

(08) පොල් වගාවේ දියුණුව සඳහා මෙන් ම පර්යේෂණ පැවැත්වීම සඳහා බතලගොඩ පොල් පර්යේෂණ ආයතනයක් පිහිටුවා ඇත. ( )

(09) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරන ලදී. ( )

(10) ශ්‍රී ලංකාවේ සිව් වැනි අගමැති තුමා වූයේ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ය. ( )

I  ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(11) දිවයිනේ ලන්දේසීන් යටතේ පැවැති ප්‍රදේශ ප්‍රධාන කොටස් තුනකට බෙදා තිබුණි. ඒවා හැඳින්වූ නම වූයේ,

1. සිවිල්රාද්  2. ලැන්රාද්
3. කොමාන්ඩරි  4. කෝරල

(12) ක්‍රි. ව. 1762 දී උඩරට පාලකයා වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා හමු වූ ජෝන් පයිබස් කුමන ජාතිකයෙක් ද?

1. පෘතුගීසි  2. ඉංග්‍රීසි
3. ලන්දේසි  4. ප්‍රංශ

(13) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පකිස්ථානය යනුවෙන් වෙන ම රටක් පිහිටුවා ගැනීමේ ප්‍රබල ව්‍යාපාරයක් ගෙන ගියේ කවු ද?

1. දඩාබායි නඕරෝජි  2. මහත්මා ගාන්ධි
3. සුරේන්ද්‍රනාත් බැනර්ජි  4. මොහොමඩ් අලි ජින්නා

(14) නිදහසින් පසුව නව වාරිමාර්ග තැනවීමේ අරමුණින් අරඹ්භ කළ ප්‍රථම බහු කාර්යය යෝජනා ක්‍රමය කුමක් ද?

1. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය  2. උඩවලවේ සංවර්ධන යෝජනා ක්‍රමය
3. ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය  4. ගොවි ජනපද ව්‍යාපාරය

(15) එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා විසින් කෝපි වත්තක් ආරම්භ කළ ප්‍රදේශය මින් කුමක් ද?

1. ගම්පොළ  2. ගන්නෝරුව
2. පේරාදෙණිය  4. ලූල් කඳුර වතු යාය

I  අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක් දැයි ලියා දක්වන්න.

(16) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන ආකාරයට අගමැති පත් කිරීම ජනාධිපතිවරයා සතු ........................................ බලයකි.

(17) වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරයා විසින් 1900 වර්ෂයේ දී ........................................ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

(18) දඩාබායි නඕරෝජි ඉන්දියානු නිදහස් ව්‍යාපාරය තුළ සිටි පැරණි නායකයෙකි. ඔහු ........................................ යන අන්වර්ථ නාමයෙන් ප්‍රකට ය.

(19) සිංකෝනා පැළෑටියෙන් මැලේරියා රෝගීන් සඳහා අවශ්‍ය වන ........................................ නැමැති ඖෂධය නිපදවනු ලැබී ය.

(20) ශ්‍රී ලංකාවේ ඉහළ ම අධිකරණය මෙන් ම අවසාන අභියාචනාධිකරණ බලය හිමි ආයතනය ........................................වේ.

(ලකුණු 20 x 2 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

(01) **(අ) සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) පෘතුගීසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය වූ ගෝව දැක්වෙන අක්ෂරය නම් කරන්න.

(ii) රෝම ගෘහ නිර්මාණ ශිල්පය ලොවට දායාද කළ රෝම නගරය දැක්වෙන අක්ෂරය නම් කරන්න.

(iii) ලන්දේසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය වූ බතාවිය පිහිටා ඇති ජාවා දූපත දැක්වෙන අක්ෂරය නම් කරන්න.

(iv) යුරෝපීයන්ට පෙර ලංකාවේ වෙළඳ ආධිපත්‍ය ලබාගෙන සිටි මුස්ලිම් වෙළඳුන්ගේ නිජ බිම වූ අරාබි දේශය දැක්වෙන අක්ෂරය නම් කරන්න. (ලකුණු 4)

**(ආ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) ඉංග්‍රීසින්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ ත්‍රිකුණාමල වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සහල් නිපදවා අමතර ආදායම් ලබා ගැනීමේ අදහසින් ලන්දේසීන් විසින් ප්‍රතිසංස්කරණය කළ යෝධ වැව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) 1818 නිදහස් සටන ආරම්භ වූ වෙල්ලස්ස ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) කෝල්බෘක් යෝජනා කළ උතුරු පළාතේ පාලන මධ්‍යස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 4)

(ඇ) දී ඇති පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.



(i) A අක්ෂරයෙන් දැක්වෙන පින්තූරයේ පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

(ii) මෙතුමා කටයුතු කළේ කුමන අරමුණක් උදෙසා ද?

(iii) මෙතුමා මූලික අධ්‍යාපනය ලැබුවේ කුමන පාසලක ද?

(iv) පරිත්‍යාගශීලීන්ගේ ආධාරයෙන් මෙතුමා යාපනයේ පළමුව ඉදි කළ පාසල කුමක් ද? (ලකුණු 4)



(ඈ) (i) B අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(ii) මෙම ගොඩනැගිල්ල කාගේ නිර්මාණයක් ද?

(iii) මෙම ගොඩනැගිල්ල පවතින රට නම් කරන්න.

(iv) මෙම ගොඩනැගිල්ල නිර්මාණය කරන ලද්දේ කුමන අධිරාජ්‍ය සමයේ ද?

(ලකුණු 4)

(02) (i) පෘතුගීසීන් හැර ආසියාවට පැමිණි වෙනත් යුරෝපීය ජාතීන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) 1818 හා 1848 නිදහස් අරගලයන් ඇසුරින් පහත වගුව පුරවන්න. (ලකුණු 4)

| වසර | ආරම්භ වූ ප්‍රදේශය | නායකයන් |
|---|---|---|
| 1818 | (a) ...................... | (b) ...................... |
| 1848 | (c) ...................... | (d) ...................... |

(iii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු 4ක් ලියන්න. (ලකුණු 4)

(03) (i) බ්‍රිතාන්‍යයන් වතු වගාවක් ලෙස මෙරට තේ වගාව ආරම්භ කිරීමට පෙර වගා කළ බෝග 3ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) තේ වගාව මෙරට ප්‍රමුඛ අපනයන ආර්ථික භෝගය බවට පත්වීමට බලපෑ හේතු 4ක් ලියන්න. (ලකුණු 4)

(iii) රබර් වගාවේ උන්නතියට බලපෑ හේතු 2ක් ලියන්න. (ලකුණු 4)

(04) (i) 1, 2, 3 පින්තූරවල දැක්වෙන පුද්ගලයන් හඳුනාගෙන නම් කරන්න.



1



2



3

(ලකුණු 3)

(ii) පංච මහා වාද අතරින් වාද හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් සිදු වූ සේවාවන් 2ක් ලියන්න. (ලකුණු 4)

(05) පහත සඳහන් වචන සටහන උපයෝගී කරගෙන දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ල | ක් | මි | ණි | ප | හ | න | ග | ල |
| ං | ස | ර | ස | වි | සි | දි | ව | බො |
| කා | ස | ද | රැ | ස | ං | ල් | තො | මි |
| නි | පො | මා | ගෝ | ව | හ | ලි | ල් | බා |
| ධා | න් | සි | ං | හ | ල | ජා | ති | ය |
| න | ඩි | ක | බි | ඌ | බෞ | ම | කැ | පො |
| ය | වෙ | තෑ | හා | රූ | ද් | දු | ලි | ල් |
| කු | රි | ග් | ඊ | තෙ | ධ | රා | ක | තෙ |
| උ | ර | ග | ල | ල් | යා | සි | ට් | ල් |

(i) මිෂනාරීන් විසින් සිය ආගම ප්‍රචාරය කිරීම සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශන 3ක් තෝරා ලියන්න.

(ලකුණු 3)

(ii) මිෂනාරීන් සමග තරගයට මෙන් බෞද්ධයන් විසින් පළ කරන ලද බෞද්ධ ප්‍රකාශ 4ක් ලියන්න.

(ලකුණු 4)

(iii) (අ) II වැනි චාල්ස් කුමරු පෘතුගාලයේ කැතරින් කුමරිය විවාහ කර ගත් නිසා පෘතුගීසීන් ඉංග්‍රීසීන්ට දායාද වශයෙන් ලබා දුන් පෘතුගීසින් සතු වූ ඉන්දියානු නගරයේ නම සොයා ලියන්න.

(ආ) වස්කෝදගාමා ඉන්දියාවට පැමිණ ගොඩබට වරාය කුමක් දැයි සොයා ලියන්න.

(ඇ) ඉන්දියානු වෙරළ ප්‍රදේශයේ බලය පතුරුවා ගැනීමට ප්‍රංශ ජාතිකයන් පිහිටුවා ගත් මධ්‍යස්ථානයේ නම සොයා ලියන්න.

(ඈ) සිපෝයි හමුදාවට ලබාදුන් එන් පීල්ඩ් නම් රයිපල්වලට යොදන පතරොම්වල ග්‍රීස් තැවරීමේ දී මුසු කළ තෙල් වර්ගයක් වචන වගුවෙන් සොයා ලියන්න. (ලකුණු 4)

(06) (i) ලංකා ජාතික සංගමයට එක් වූ කුඩා සංවිධාන ඇසුරින් සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




(ලකුණු 3)

(ii) ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ කීපයකට අදාළ පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයේ නම | කරන ලද ප්‍රතිසංස්කරණ |
|---|---|
| 1. .................................... | උඩරට හා පහතරට ඒකාබද්ධ පාලන ක්‍රමයක් හඳුන්වා දීම. |
| 2. .................................... | පළාත් බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම. |
| 3. .................................... | ව්ධායක කාරක සභා පිහිටු වීම. |
| 4. .................................... | අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම. |

(ලකුණු 4)

(iii) පහත සඳහන් වන්නේ ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ තනතුරු කීපයක් හා එම තනතුරු දැරූ පුද්ගලයන් ය. ඔවුන් නිවැරදිව ගළපා ලියන්න.

| A | B |
|---|---|
| 1. ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා | a. ඩී. එස්. සේනානායක මහතා |
| 2. ප්‍රථම අගමැති | b. විලියම් ගොපල්ලව මහතා |
| 3. ප්‍රථම විධායක ජනාධිපති | a. ජෝන් කොතලාවල මහතා |
| 4. ප්‍රථම ජනාධිපති | d. හෙන්රි මන්ක් මේසර් මුවර් මහතා |
| | c. ජේ. ආර්. ජයවර්ධන මහතා |

(ලකුණු 4)

(07) (i) 1972 ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ජාතික රාජ්‍ය සභාවේ කාර්යයන් 3ක් ලියන්න. (ලකුණු 3)

(ii) 1972 ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටු වූ අධිකරණ ආයතන 4ක් ලියන්න. (ලකුණු 4)

(iii) පහත සඳහන් වන්නේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ආකාරයට ජනාධිපති සතු වූ බලතල කීපයකි. ඒවා අතරින් ඔහු සතු ව්‍යවස්ථාදායක බලතල 4ක් තෝරා ලියන්න.

A. රජයේ උසස් නිලධාරීන් පත් කිරීම.

B. පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම, විසුරුවා හැරීම.

C. ජාතික උත්සව වල මුලසුන දැරීම.

D. පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ මුලසුන දැරීම.

E. ජාත්‍යන්තර වශයෙන් ජනරජය නියෝජනය කිරීම.

F. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

G. අධිකරණ සේවා කොමිෂන් සභාව පත් කිරීම.

H. ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීම හා පාර්ලිමේන්තුව ඇමතීම.

(ලකුණු 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 9 - 2019

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

## I කොටස

(01) රෝම ලන්දේසි
(02) ජෝන් ඩොයිලි
(03) මුස්ලිම් නෙයිසන්
(04) සිපෝයි
(05) විසි එකට
(06) 3
(07) x
(08) x
(09) 3
(10) 3
(11) කොමාන්ඩරි
(12) ඉංග්‍රීසි
(13) මොහොමඩ් අලි ජින්නා
(14) ගල් ඔය සංවර්ධන යෝජනා ක්‍රමය
(15) ගන්නොරුව
(16) විධායක
(17) වාරිමාර්ග
(18) සම්භාවනීය මහල්ලා
(19) ක්විනින්
(20) ශ්‍රේෂ්ඨාධිකරණය

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

(01) (අ) (i) C (ii) E (iii) H (iv) B (ලකුණු 4)

(ආ) (i) J (ii) D (iii) G (iv) L (ලකුණු 4)

(ඇ) (i) ආරුමුගනාවලර්තුමා
(ii) හින්දු ආගමික පුනර්ජීවනය
(iii) මිෂනාරි පාසලක
(iv) ශෛව ප්‍රකාශ් විද්‍යා ශාලෙ (ලකුණු 4)

(ඈ) (i) ටජ් මහල්
(ii) ෂා ජහන් රජු
(iii) ඉන්දියාවේ
(iv) මුගල් අධිරාජ්‍යය (ලකුණු 4)

(02) (i) ලන්දේසි, ප්‍රංශ, ඉංග්‍රීසි (ලකුණු 3)

(ii) a. ඌව වෙල්ලස්ස
b. කැප්පෙටිපොළ නිලමේ, මඩුගල්ලේ දිසාව, කිවුලෙගෙදර මොහොට්ටාල, පිළිමතලව්වේ දෙවන අධිකාරම්, බූටෑවේ රටේ රාළ, කොහු කුඹුරේ රාළ
c. මාතලේ
d. ගොංගාලේ ගොඩබණ්ඩා, වීර පුරන්අප්පු, කඩහපොල හිමි (ලකුණු 4)

(iii) * විධිමත් ලෙස සංවිධානය නොවීම.
* ඉංග්‍රීසීන් විසින් සටන අඩපණ කිරීමට යෙදූ දැඩි මර්ධනකාරී ප්‍රතිපත්තිය
* සටන මෙහෙය වූ නායකයින් අතර තිබූ පෞද්ගලික අමනාපකම්
* ඉංග්‍රීසීන්ගේ දියුණු අයුධ ශක්තිය
* රජු ලෙස පෙනී සිටි දොරේසාමි නියම දොරේ සාමි නොවන බව දැනගත් විට සටන්කරුවෝ අධෛර්යමත් වීම. (මෙයින් හතරක් ලිවීම) (ලකුණු 4)

(03) (ii) කෝපි, සිංකෝනා, කොකෝවා (ලකුණු 3)

(ii) * තෙත් කලාපයේ තේ වගාවට උචිත පරිසරයක් තිබීම.

* ශ්‍රී ලංකාවේ තේ සඳහා ලන්ඩන් හා ලෝක වෙළඳපලේ ඉහළ ඉල්ලුමක් තිබීම.

* දුම්රිය හා මහාමාර්ග දියුණු වීම.

* පහසු හා ලාභදායී ශ්‍රමිකයන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගැනීම.

* අඩු නිෂ්පාදන වියදමකින් වැඩි ලාභ ඉපයීමට හැකි වීම.

(මින් 4ක් ලිවීමට) (ලකුණු 4)

(iii) * මෙරට නිපද වූ රබර්වලට ඇමෙරිකා එක්සත් ජනපදයේ විශාල ඉල්ලුමක් පැවතීම.

* පළමු වන ලෝක යුද්ධයෙන් පසු ලෝක වෙළෙඳපොළේ රබර් මිල ඉහළ යාම.

* යුරෝපයේ මෝටර් රථ කර්මාන්තය දියුණුවට පත් වීම සහ රබර්වලට ඇති ඉල්ලුම ඉහළ යාම.

* රබර් වගාව සඳහා වඩාත් උචිත පසක් හා දේශගුණ තත්ත්වයක් මෙරට පැවතීම. (මින් 2ක් ලිවීමට)

(ලකුණු 4)

(04) (i) 1 - හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

2 - අනගාරික ධර්මපාල තුමා

3 - සිද්දි ලෙබ්බේ මහතා (ලකුණු 3)

(ii) 1. බද්දේගම වාදය 2. වරාගොඩවාදය

3. පානදුරාවාදය 4. උදන්විට වාදය

5. ගම්පොල වාදය මෙයින් 4ක් දැක්වීමට (ලකුණු 4)

(iii) * බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීමට පුරෝගාමී වීම.

* ඉරු දින දහම් පාසල් ඇරඹීම

* වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීමට පුරෝගාමී වීම.

* බෞද්ධ කොඩිය නිර්මාණය කිරීමට පුරෝගාමී වීම.

මෙයින් 2ක් ලිවීමට (ලකුණු 4)

(05) (i) මාසික තෑග්ග, උරගල, ලංකා නිධානය (ලකුණු 3)

(ii) ලක්මිණි පහන, සිංහල ජාතිය, සරසවි සඳ රැස, සිංහල බෞද්ධයා (ලකුණු 4)

(iii) (අ) බොම්බාය (ආ) කැලිකට් (ඇ) පොන්ඩිචෙරි (ඈ) ගව තෙල් / ඌරු තෙල්

(ලකුණු 4)

(06) (i) 1 - හලාවත සංගමය , 2 - යාපන සංගමය , 3. ලංකා ජාතික සංවිධානය (ලකුණු 3)

(ii) 1 - කෝල්බෲක්, 2 - මැනිං ඩෙවොන්ෂයර් , 3 - ඩොනමෝර්, 4 - සෝල්බරි (ලකුණු 4)

(iii) d, a, e, b (ලකුණු 4)

(07) (i) - නීති සම්පාදනය - මූල්‍ය පාලනය

- විධායකය පාලනය (ලකුණු 3)

(ii) - ශ්‍රේෂ්ඨාධිකරණය - මහාධිකරණය

- දිසා අධිකරණය - මහේස්ත්‍රාත් අධිකරණය

- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා අධිකරණය (මෙයින් 4ක් ලිවීම (ලකුණු 4)

(iii) B, D, F, H (ලකුණු 4)